www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව තුල බඩු මිල ඉහල යාම කෙරෙහි කෝපය වැඩෙයි

## Anger grows over rising prices in Sri Lanka

**අපේ වාර්තාකරුවන් විසිනි**
**2008 අප්‍රේල් 11**

පෙබරවාරි මාසයේ දී සියයට 24ක් වූ ශ්‍රී ලංකාවේ වාර්ෂික උද්ධමනය මාර්තු මාසයේ දී සියයට 28 දක්වා ඉහල නැගුනි. අත්‍යවශ්‍ය භාන්ඩවල මිල වේගයෙන් ඉහල යමින් තිබේ. ප්‍රවාහන ගාස්තු සහ නිවාස කුලිය සම්බන්ධ උද්ධමන රේට්ටුව සියයට 24 සහ 11 ඉහල නැගුන අතර ආහාර සහ පාන වර්ග සඳහා උද්ධමන රේට්ටුව සියයට 37ක් විය.

පසුගිය මාස තුන තුල කොලඹ පාරිභෝගික මිල දර්ශකය දෙසැම්බර් මාසයේ දී 5,955 සිට මාර්තු වන විට 6,442 දක්වා ඒකක 487 වර්ධනය වූ අතර කම්කරුවන්ගේ, ගැමි දුප්පතුන්ගේ සහ ශිෂ්‍යයන්ගේ ජීවන තත්වයන් තියුනු ලෙස බාදනය වෙමින් තිබේ. මහජනතාව විශේෂයෙන්ම කෝපයට පත්ව සිටින්නේ ඉමහත් දුෂ්කරතා නිර්මානය කරමින් ප්‍රධාන ආහාරය වන සහල් මිල පසුගිය වසරේ ජනවාරි මාසයේ සිට දෙගුනයකින් ඉහල නැගීම සම්බන්ධව ය. මේ වසර අග වන විට පාන් මිල රුපියල් 100 දක්වා තුන් ගුනයකින් ඉහල යා හැකි බව ආන්ඩුව පිලිගෙන තිබේ.

ඉහල නැගෙන මහජන අතෘප්තිය කෙරෙහි සංවේදී වෙමින් සහල් තොග සපයන ලෙස ආන්ඩුව ඉන්දියාවෙන් ඉල්ලා සිටියේ ය. එහෙත් හිඟතාවය සහ දේශීයව ආහාර මිල ඉහල යමින් තිබෙන නිසා ඉන්දියාව සහල් ඇතුලු ආහාර ද්‍රව්‍ය 40ක් අපනය කිරීම නතර කර ඇත. ඊලඟට කොලඹ ආන්ඩුව පකිස්තානයෙන් සහල් ඉල්ලා ඇති නමුත් ලැබුනේ ඒ හා සමාන පිලිතුරකි. සහල් ඉල්ලා සිටීම සඳහා දැන් වෙලඳ ඇමතිවරයා බුරුමයට යවා තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව චීනය, කාම්බෝජය සහ වියට්නාමය ද ආහාර ද්‍රව්‍ය අපනය සීමා කර ඇත.

සහල්, තිරිඟු පිටි, කිරි පිටි සහ සෙසු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙන් ම තෙල් මිල පෙර නොවූ විරූ ලෙස ඉහල නැගීමත් සමග මෙම දුෂ්කරතාවයන් අර්බුදයේ ගෝලීය ස්වභාවය ඉස්මත්තට ගෙනැවිත් තිබේ. ඉහල යන මිල ගනන් නිසා දුප්පත් රටවල විරෝධතා ව්‍යාපාර සහ කැරලි පැන නගිනු ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානුෂික කටයුතු පිලිබඳ නියෝජ්‍ය ලේකම් සර් ජෝන් හොල්මිස් පසුගිය සතියේ ඩුබායිහි දී අනතුරු ඇඟවූයේ ය. පසුගිය වසරේ මැද භාගයේ සිට ආහාර මිල ඉහල නැගීමේ සාමාන්‍යය සියයට 40 බව ඔහු පැවසුවේ ය.

ලෝක ධනවාදය විසින් නිෂ්පාදිත සාධක කිහිපයක් ලෝක පරිමානව ආහාර හිඟයට සහ මිල ඉහල නැගීමට තුඩු දී ඇත. චීනය, ඉන්දියාව සහ ඉහත දී සුලු පරිමාන ගොවිතැන ආධිපත්‍යය දැරූ සෙසු රටවල්වල දැවැන්ත නාගරීකරනය, ජීව ඉන්දන නිෂ්පාදනය සහ ඉඩම් සහ අස්වැන්න යොදා ගැනීම සහ ආහාර සහ සෙසු වෙලඳ භාන්ඩ සම්බන්ධව පලල්ව පැතුරුන සමපේක්ෂනයන් මෙයට ඇතුලත්ය. කොටස් වෙලඳපොල අලාභයන් ඉහල යාම නිසා භෝග සහ ප්‍රධාන ආහාර වර්ග මිලදී ගැනීම සඳහා ආයෝජකයන් කොටස් වෙලඳපොලවලින් අරමුදල් ඉවත් කර ගන්නා බව මෙම සතියේ නිකුත් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික පෙර දැක්ම ප්‍රකාශනයේ නවතම කලාපය සඳහන් කලේ ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් 2006 වසරේදී දිවයින යලි වතාවක් යුද්ධයට ඇද දැමීමෙන් පසුව දැවැන්ත ලෙස මිලිටරි වියදම ඉහල යාම මගින් ශ්‍රී ලංකාව තුල තත්වය තවත් උග්‍ර වී ඇත. මෙම වසරේ දී ආරක්ෂක වියදම් සඳහා රුපියල් බිලියන 167 පමන මුදලක් නොවැම්බර් මාසයේ අයවැය ලේඛනයෙන් වෙන් කර තිබේ. එය පසුගිය වසරට වඩා සියයට 20ක වැඩිවීමකි. යුද්ධයට ගෙවීම සඳහා ආන්ඩුව බදු ඉහල දැමීම, ඉහල පොලී අනුපාතයන්ට නයට ගැනීම සහ මුදල් අච්චු ගැසීම කරනු ලබයි. මෙම සියලු ම පියවරයන් මගින් මිල ගනන් තව තවත් ඉහල නංවනු ලබයි.

ඉහල යන ජීවන වියදම සම්බන්ධව ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) වාර්තාකරුවෝ කම්කරුවන්, ශිෂ්‍යයන් සහ තරුනයන් සමග කතා කලහ. සාමාන්‍ය මහජනතාව මත බර පැටවීම ගැන ඔවුහු රාජපක්ෂ ආන්ඩුව කෙරෙහි අප්‍රසාදය පලකලහ.

මිල ඉහල යාම තදින්ම බලපා ඇති එක් කොටසක් වන්නේ වතු කම්කරුවෝ ය. ඔවුන්ගෙන් බොහෝ දෙනා තවමත් ජීවත් වන්නේ බ්‍රිතාන්‍ය පාලන කාලය තුල ගොඩනැගූ මූලික පහසුකම්වලින් පවා තොර ඉතා කුඩා ලයින් කාමරවල ය. දැන් ඔවුන්ගේ

පවුල් දිනකට එක වේලක් මගහැරීමට පටන් ගෙන ඇත.

හැටන් ප්‍රදේශයේ ස්ට්‍රැත්ඩන් වත්තේ සුබ්‍රමානියම් මෙසේ ප්‍රකාශ කලේ යඃ "රාජපක්ෂ යටතේ බඩු මිල තුන් ගුනයකින් ඉහල නැගිලා. අපේ දෛනික වැටුප් රුපියල් 300 දක්වා දෙගුනයකින් වැඩි කරන ලෙස ඉල්ලා 2006 දෙසැම්බර් මාසයේ අප වර්ජනයක් කලා. එම අවස්ථාවේ තිරිඟුපිටි කිලෝවක මිල රුපියල් 22යි. හාල් කිලෝවක් රුපියල් 25යි.ලාම්පුතෙල් ලීටරයක් රුපියල් 32යි. පොල් ගෙඩියක් රුපියල් 12යි. දැන් ඇතිවෙලා තිබෙන වෙනස බලන්න! මෙම මිල ගනන් පිලිවෙලින් රුපියල් 75, 80, 80 සහ 45 දක්වා ඉහල ගිහිල්ලා.

"මෙම ආන්ඩුව යුද්ධය සඳහා දිනපතා රුපියල් මිලියන ගනනක් වියදම් කරනවා. යුද්ධය නතර කලොත් හුඟක් ප්‍රශ්න විසඳන්න පුලුවන් වෙයි. ලෝක වෙලඳපොලේ තෙල් සහ තිරිඟු පිටි මිල ඉහල නගින බව මා දන්නවා. ලෝක වෙලඳපොලේ රුපියල් 5ක් වැඩිවෙන කොට අපේ රුපියල් 10 වැඩි වෙනවා. කම්කරුවන් මෙම මර්දනයට විරුද්ධ සටන් කරලා ඔවුන්ගේ ජීවන තත්වයන් ඉහල දමා ගන්න ඕනෑ. නමුත් නායකත්වයක් නැහැ."

හැටන් පෙන්මූර් වත්තේ සිව් දරු පියෙකු වන 48 හැවිරිදි ජදීසන්ඃ "මේ දරාගන්න බැරි ජීවන වියදම යටතේ මගේ පවුලේ අනාගතය ගැන මට හිතාගන්නවත් බැහැ. කලින් වගේ මේ දවස්වල අපට දවසට තුන් වේලම කන්න බැහැ. හැදෙන දරුවන්ට හොඳ ආහාර ලැබුනෙ නැත්නම් ඔවුන් ලෙඩ්ඩු වෙනවා. හොඳ ආහාර නැතුව දිගටම වැඩ කරන්න මගේ ඇඟටත් ශක්තිය නැහැ. අප අසනීප වුනොත් මේ වතුවල අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නැහැ. කිලෝමීටර් 6ක් දුරින් පිහිටි වෙන වත්තකට අප ඒ සඳහා යන්න ඕනෑ.

"වතු අංශයේ සුබසාධන පහසුකම් වැඩි දියුනුවෙලා කියලා වෘත්තීය සමිති නායකයන් මාධ්‍යවලට සම්මුඛ සාකච්ඡා දෙනවා. නමුත් ඇත්තටම නම් තත්වය හොඳටම නරක අතට හැරිලා තියෙන්නේ. දවසකට අපට ලැබෙන්නේ රුපියල් 200යි. රුපියල් 120ක් පැමිනීමේ දීමනාව ලැබෙන්නේ කලාතුරකින්. මාසයකට දවස් 25ක් වැඩ කලේ නැත්නම් ඒක ලැබෙන්නෙ නැහැ. හිතලා බලන්න දවසකට රුපියල් 200 පවුලකට මොනවද ගන්න පුලුවන්."

ජනවාරි මාසයේ දී රුපියල් 190 වූ කිරිපිටි පැකට්ටුවක් දැන් රුපියල් 275ට විකුනන බවවිශ්‍රාමික කම්කරු කාන්තාවක වූ එස්. කාලිඅම්මා පැවසීය. කිරිපිටි වලට වැඩිපුර වතුර මිශ්‍ර කිරීමට වතුකම්කරු පවුල්වලට බලකෙරිලා තියෙන බව ඇය පැවසීය. 1912 ගොඩනගපු ලයින් කාමරයේ ඇතුලත තත්වය ඇය අපට පෙන්වීය. හොඳ ජල පහසුකම් හෝ වැසිකිලි පහසුකම් ඒකට තිබුනෙ නැහැ. "වඩ වඩා නරක අතට හැරෙනවා මිසක් අපේ ජීවන තත්වයන්ගේ වැඩිදියුනු වීමක් අප දැක නැතැයි" ඇය පැවසීය.

නිදහස් වෙලඳ කලාපයේ කම්කරුවන්ගේ තත්වය ඊට වඩා වැඩි වෙනසක් නැත. කටුනායක නිදහස් වෙලඳ කලාපය තුල කම්කරුවෝ 50,000 පමන සේවය කරති. ඔවුන්ගෙන් බහුතරය කාන්තාවෝය. ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනය සඳහා පවතින විශාලතම වෙලඳපොල එක්සත් ජනපදය නිසා එක්සත් ජනපද ආර්ථික පසුබෑස්ම ඔවුන්ගේ රැකියා කෙරෙහි බලපානු ඇතැයි කම්කරුවන් තුල බියක් පවතී. ජැක්ලංකා සමාගමේ ෆැක්ටරි දෙක කම්කරුවන්ට ජනවාරි මාසයේ ඔවුන්ගේ සම්පූර්න වැටුප නොලැබුන අතර පෙබරවාරි මාසයේ මුල ඔවුන් 1400 රැකියා අහිමි කරමින් ෆැක්ටරි දෙක වසා දැමුනි.

එක්සත් ජනපදයට අයත් ස්ටාර් ගාමන්ට් ෆැක්ටරියේ තරුන කාන්තා කම්කරුවෙකු වූ නිශාන්ති අපට මෙසේ පැවසීයඃ "මා අවුරුද්දක් මෙතන වැඩ කරනවා. මා පටන් ගන්න කොට මගේ මාසික මූලික වැටුප රුපියල් 6,200යි. වර්ජනයක ප්‍රතිඵලයක් ලෙස දෙසැම්බර් මාසයේ දී රුපියල් 1,500ක් පඩිය වැඩි වුනා. අප අතිකාල කලොත් අපට තව ටිකක් වැඩියෙන් උපයා ගන්න පුලුවන් නමුත් එතකොට අප වැඩ කරන කාලය පැය 12 දක්වා දික්වෙනවා. අප නිවාඩු ගත්තොත් අපේ පැමිනීමේ දීමනාව කපනවා.

"මාසෙක රුපයල් 2,000 නිවාස කුලිය මගේ මිතුරියක් සමග බෙදාගන්නවා. ආහාර පිසීමට අප පාවිච්චි කරන්නෙ ලාම්පුතෙල්. ගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේ ලාම්පුතෙල් මිල කිහිප වතාවක් ඉහල ගියා. හාල්, සබන්, බිස්කට්, කිරිපිටි රෙදි සහ අනෙක් හැම දේකම මිල ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දෙ දෙතුන් ගුනයකින් වැඩිවෙලා. අපට හොඳ කෑම වේලක් කන්න බැහැ.

"කිරිපිටි ඇතුලු බොහෝ දේවල් ආහාරයට ගැනීමෙන් වලකින්න අපට සිද්ධවෙලා තියෙනවා. කලින් වගේ අපට රෙදි මිලදී ගන්න බැහැ. මගේ ලමයගේ ගිනුමට මාසෙකට රුපියල් 1,000 අමාරුවෙන් දානවා. නමුත් අනාගතය ගැන හිතාගන්නවත් බැහැ.

"දුප්පතුන්ට යමක් කරයි කියලා හිතලා මා මේ ආන්ඩුවට ඡන්දය දුන්නා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය වරින් වර රට පාලනය කලා නමුත් දුප්පතුන්ට කිසිම යහපතක් වෙලා නැහැ.

"අත්‍යවශ්‍ය බඩු මිල ඉහල යෑමට යුද්ධය හේතුවක් බව මා පිලිගන්නවා. අපට දැනෙන ආර්ථික දියුනුවක් රටේ නැහැ. යුද්ධය නතර කල යුතුයි. එයට ගොදුරු වෙන්නෙ දුප්පත් මිනිස්සු. යුද්ධය නිසා අපට බස් එකකවත් යන්න බයයි. අපට අවශ්‍ය දැරියහැකි මිලකට බඩු මිල දී ගත හත හැකි සාමකාමී සමාජයක්."

නය මුදල්වලට කපා ගත් පසුව ගෙදර ගෙනයාමට ඔහුට ඉතිරි වන්නේ වැටුපෙන් රුපියල් 7,000ක් පමන බව රත්මලාන දුම්රිය වැඩ පලේ කම්කරුවෙකු වූ එල්.එස්. ද සොයිසා පැවසුවේය. ඔහුට දරුවන් තිදෙනෙකු සිටින අතර ඉන් රැකියාවල නිරතව සිටින්නේ දෙදෙනෙකු පමනි. නිවාස කුලිය රුපියල් 800, විදුලි බිල සඳහා රුපියල් 1,000 සහ දුරකථන බිල සඳහා රුපියල් 1,200ක් ඔහු ගෙවයි.

"මගේ පවුලේ මාසික වියදම සඳහා ක්‍රෙඩිට් කාඩ් එක පාවිච්චි කරන නිසා මා දස දහස් ගනනක් බැංකුවලට නයයි. මගේ පඩියෙන් වැඩි කොටසක් වියදම් වෙන්නේ කෑමට. අනෙක් වියදම්වලට ලැබෙන පඩිය ප්‍රමානවත් නැහැ. ලෝක වෙලඳපොලේ මිල වෙනස්වීම අනුව රටේ ආහාර ද්‍රව්‍යවල මිල ඉහල යන බව ආන්ඩුව කිව්වත්, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ආහාර ද්‍රව්‍යවල මිලත් ඉහල නැග ඇති බව ඔහු පැවසුවේ ය.

"මා යුද්ධයට සහයෝගය දෙන කෙනෙක් නෙමෙයි. දෙමල ජනතාවට බොහොම අකටයුතුකම් කෙරෙනවා. ඔවුන්ට රැකියා සහ කලමනාකරන නිලතල දීම ප්‍රතික්ෂේප කරනවා. මේ වාර්ගික ප්‍රශ්නය යුද්ධය මගින් විසඳන්න බැහැ. මා හිතන්නේ ජයග්‍රහනයක් ලැන කියමින් ආන්ඩුව මහජනයා රවට්ටනවා." ඔහු පැවසුවේය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති ගැන සොයිසා අප්‍රසාදය පලකලේ ය. "සමහර වෘත්තීය සමිති නායකයන් කියනවා ඔවුන් පඩි වැඩිකරවා ගන්න උත්සාහ කරනවා කියලා. නමුත් ජවිපෙ නායකයන් වගේ අය ආන්ඩුවට සහයෝගය දෙමින් යුද්ධය දියත් කිරීම ගැන ආන්ඩුවට ප්‍රශංසා කරනවා. එකම පැරනි පක්ෂයක්වත් වැඩ කරන ජනතාවගේ ආර්ථික සහ සමාජ කොන්දේසි වැඩි දියුනු කිරීමට සටන් කරන්නේ නැහැ."

ඉහල යන මිල ගනන් සමග ජීවිතය පවත්වා ගෙන යාමට ශිෂ්‍යයන් අරගලයක යෙදී සිටින බව කොලඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ සිසුවෙකු වන ඉන්දික පැවසීය.

"දවසකට රුපියල් 30 ගමන් ගාස්තු වශයෙන් මට වැයවෙනවා. සහනදායක මිලකට ලැබෙන නිසා මාළුදේසහ දවල් ආහාර ගන්නේ විශ්වවිද්‍යාල කැන්ටිමෙන්. මේ ආහාර වේල් දෙකට මා දැන් රුපියල් 50ක් ගෙවිය යුතුයි. 2005 දී එලවලු තුනක්, මස් හෝ මාලු සමග කෑම පිඟානක් රුපියල් 13යි. දැන් රුපියල් 25යි. ඔවුන් දැන් ඒක රුපියල් 30 කරන්න යනවා. ඒක හොඳ හෝ ප්‍රමානවත් ආහාර වේලක් නෙමෙයි.

"ලිපිද්‍රව්‍ය සහ ෆොටෝ කොපිවලට මාසෙකට රුපියල් 1,000ක් පමන වියදම් වෙනවා. මා වගේ දුප්පත් ශිෂ්‍යයන්ට මාසෙකට රුපියල් 2,500 මූල්‍ය ආධාරයක් ආන්ඩුවෙන් ලැබෙනවා.නමුත් අත්‍යවශ්‍ය වියදම් පිරිමහගන්න ඒක ප්‍රමානවත් නැහැ. බොහෝ ශිෂ්‍යයන්ට අර්ධ රැකියාවල යෙදෙන්න බලකෙරිලා තියෙනවා. චිත්‍රපටයක් බලන්නවත් අපට කාලය හෝ මුදල් නැහැ."

© www.wsws.org